www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

# Royal College - Colombo 07

## රාජකීය විද්‍යාලය කොළඹ 07

**Grade 6 - First Term Test - April 2019**

**පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 6 ශ්‍රේණිය**

කාලය - පැය 02
Time - 2 hours

## Sinhala - I

## සිංහල - I

Name : .................................................... Grade : ...................... Index Number : .........................

- **පහත සඳහන් වාක්‍යයේ ඉරි ඇඳි පදයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.**

1) මිතුරන්ට අතදීම නිසා සඳරු කා අතරින් ජනප්‍රියත්වයට පත්විය.
   i. අතට අත දීම
   ii. උදව් කිරීම
   iii. කථාබහ කිරීම
   iv. ධනය ලබා දීම

- **පහත වචනවලට වඩාත් සමීප අර්ථය දෙන වචනය පිළිතුරු අතරින් තෝරන්න.**

2) අඬපාලා
   i. සීනාසී
   ii. හඬනගා
   iii. කථාකොට
   iv. අඬා

3) වෘද්ධත්වය
   i. බුද්ධිමත්බව.
   ii. වැඩිහිටිබව
   iii. තරුණබව
   iv. නීරෝගිබව

- **පහත සඳහන් පදවලට විරුද්ධ අර්ථය දෙන වචනය පිළිතුරු අතරින් තෝරන්න.**

4) නිශ්චල
   i. සසල
   ii. නිශාචර
   iii. චංචල
   iv. සංචල

5) ආරක්ෂිත
   i. සුරක්ෂිත
   ii. විනයාරක්ෂිත
   iii. සංරක්ෂිත
   iv. අනාරක්ෂිත

- **අක්ෂර වින්‍යාසය නිවැරදි වචනය තෝරන්න.**

6) i. සංක්‍රමනය ii. ශාස්තෘන් iii. සම්මුඛ iv.මනුෂ්‍යා

7) i. විස්මය ii. තත්වය iii. ප්‍රබන්ද iv.ඓෛක්‍යය

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

- පහත වාක්‍යයේ ඉරි ඇඳි අකුරේ පිල්ලම් පිළිවෙළින් යෙදී ඇති පිළිතුරු තෝරන්න.

8) ශිෂ්‍යයෝ ගුරුතුමාට ගෞරවයෙන් වන්දනා කළහ.

i. කොම්බුව, ඉස්පිල්ල, පාපිල්ල, ගයනුකිත්ත
ii. කොම්බුව, ඇලපිල්ල, පාපිල්ල, ගයනුකිත්ත
iii. පාපිල්ල, කොම්බුව, ඇලපිල්ල, ගයනුකිත්ත
iv. කොම්බුව, පාපිල්ල ඇලපිල්ල, ගයනුකිත්ත

- පහත වාක්‍ය හරි නම් (√) ලකුණ ද වැරදිනම් (X) ලකුණ ද වරහන් තුළ යොදන්න.

9) "නුඹලා බිතුසිතුවම් නරඹන්නෙහු" නිවැරදි වාක්‍යයකි ( )

10) "වෛද්‍යවරයා" යන්නෙහි බහු වචනය වන්නේ "වෛද්‍යවරයෝ ය." ( )

11) අක්ෂර මාලාවේ සෑම 'ව්‍යඤ්ජන' අක්ෂරයක්ම හල් කළ හැකිය. ( )

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

12) ප්‍රථම පුරුෂ ඒක වචන පදයකි.
i. ළමයා ii. මම iii. නුඹ iv. මිනිස්සු

13) පහත ක්‍රියා පද අතරින් උත්තම පුරුෂ බහුවචන ක්‍රියාපදය තෝරන්න.
i. සොයන්නෙහි ii. කැමැත්තෙමි iii. නොදන්නෙමු iv. දුන්නේය

- පහත වාක්‍යවලට ගැළපෙන නිවැරදි වචනය වරහන් තුළින් තෝරන්න.

14) කවියා සොබාදහමේ අසිරිය ........................................ කරමින් කවි ගොතයි.
(i. පරිහරණය ii. වර්ණනා iii. ආවරණය iv. නිරාවරණය)

15) " සිරිත් මල්දම" ........................................ සම්පන්න ජීවිතයකට මග පෙන්වයි.
(i. විප්‍රකාර ii. අපචාර iii. විචාර iv. සදාචාර )

- පහත වාක්‍යවල හිස්තැනට ගැළපෙන පදය තෝරා තිත් ඉර මත ලියන්න.

16) ........................................ (ලේඛකයෝ/ලේඛකයන්) පාඨකයන් දැනුවත් කරති.

17) සිරිමත් යහපත් ළමයෙකු........................................ (වුහ/විය) .

- අක්ෂර වින්‍යාසය නිවැරදි වචනය තෝරා ඉරක් අඳින්න.

18) කුමාරයා ගවු (ගණනක්/ගනනක්) ඇවිද ගියේ ය.

19) (සියලු/සියළු) සතුන් බියෙන් තැති ගත්හ.

20) පොරමොලාගේ බිරිඳ වූ (කලු/කළු) මසුන් එකතු කළාය .

(ල.2x20= 40)



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

## II කොටස

- 1 හා 2 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.

1) පන්ති කාමරයේදී ඇගයීමක් ලෙස ඔබ නිර්මාණය කළ 'පෝස්ටරය' අසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

 i. පොස්ටරය නිර්මාණය කළේ කුමන පාඩම ඇසුරෙන්ද?
 ii. පෝස්ටරයට යෙදූ මාතෘකාව කුමක්ද?
 iii. එම පෝස්ටරය නිර්මාණයේදී ඔබට පැවරුණු කාර්යය කුමක් ද?
 iv. එම නිර්මාණයේ දී ඔබට ලැබුණු ගුරු උපදෙස් 2ක් ලියන්න.
 v. පෝස්ටරය නිර්මාණය කිරීමට අදාළ කරගත් පාඩමෙන් ඔබට ලැබුණු ආදර්ශ දෙකක් ලියන්න.
 vi. මෙම ක්‍රියාකාරකමේදී ඔබ මුහුණ දුන් ගැටලු 2ක් ලියන්න.
 vii. එම ගැටලු විසඳීමට ගනු ලැබූ පියවර 2ක් ලියන්න.
 viii. පෝස්ටර නිර්මාණය මඟින් ලැබෙන ප්‍රයෝජනයක් ලියන්න.

(ල.2x8= 16)

2) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 125 ට නොඅඩු රචනයක් ලියන්න.
 1. යහගුණදම් පුරුදු කරමු.
 2. සොබා දහමේ අසිරිය.
 3. මා කියවූ රසවත් පොත.
 4. ගමා හා කයිරා සමඟ ගත කළ සොඳුරු දිනක්. (ලකුණු 14)

3)
 i. පහත අවස්ථාවලින් එකක් ඇසුරින් සුබ පැතුම් පතක් සකස් කරන්න.
  1. ක්‍රීඩා තරගයකින් විශිෂ්ට ලෙස ජයගත් තම මිතුරාට
  2. විශ්ව විද්‍යාල ප්‍රවේශයට වරම් ලැබූ තම සොහොයුරාට/ සොහොයුරියට
  3. උපන් දිනය සමරන මවට හෝ පියාට

 නැතහොත්

 ii. ඔබ නැරඹීමට ගිය සුන්දර ස්ථානයක් පිළිබඳ විස්තර කරමින් දුර බැහැර සිටින ඥාතියෙකුට පෞද්ගලික ලිපියක් ලියන්න.

(ලකුණු 14)

4) ඉර උදා වන්නට
පළමුව නැගිට සිහිකොට
..............................................
..............................................



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

1. ඉහත කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
2. මෙම පදය ඇතුළත් ග්‍රන්ථය නම් කරන්න.
3. මෙම පදය අයත්වන්නේ කුමන කවි ගණයටද?
4. මෙම පද්‍ය පන්තියේ නිර්මාණකරුවා කවුද?
5. පහත සඳහන් පද වලට සමාන පද කවියෙන් තෝරා ලියන්න.

i. රිවි -
ii. මුලින් -

(ල.2x5= 10)

5) පහත ඡේදය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රුකඩ කපන්නාගේ කම්මල වූ කලි කාමරයකින් ඉස්තෝප්පුවකින් ද යුතු මැටි ගසා අතු සෙවෙණි කළ පැල්පතකි කපා නිම කළ, නොකළ රූකඩයකින් ද සායම් හා වේළීමට තැබූ විචිත්‍ර වර්ණයෙන් බබළන රූකඩින්ද නියන්, කැති, පිහිය, කෙටේරි, සායම් ටින්, බුරුසු, සතුන්ගේ ඇටකටු, දත්, තිය, ඔලිඳ ඇට යනාදියෙන්ද පිරි ඔහුගේ කම්මලෙහි ඇතුළු කාමරය වූ කලි නියම කටුගෙයක් විය. ඉස්තෝප්පුවේ කොනක වූ වතුර සැළියක් ගත් ලිග්ගල් තුනකින් යුතු උදුනෙන් දුම් නොනගින්නේ දවල් දොළහේ සිට එක දෙක වනතෙක් පමණි.

1. රූකඩ කපන්නාගේ පැල්පත ඉදිකර තිබුණේ කුමන දේ යොදාගෙනද? (ල. 2)
2. ඔහුගේ කම්මලෙහි ඇතුළු කාමරයේ තිබූ දේවල් 4ක් ලියන්න. (ල. 2)
3. ඔහුගේ ඉස්තෝප්පුවේ තිබුණේ මොනවාද? (ල. 2)
4. පහත වචන වලට සමාන පද ඡේදයෙන් තෝරා ලියන්න.
   ලිප
   කෞතුකාගාරය
   දිවා
   ආලින්දය (ල. 4)

මුළු ලකුණු 10

6) පහත ප්‍රකාශ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

| උපුටාගත් ප්‍රකාශය | "හනික, හනික, බලා ඉන්ට කල් නෑ" | "මොකද යාළුවා, හපන්නට බැරිද?" |
|---|---|---|
| ප්‍රකාශය කරනු ලැබුවේ කවුද? | | |
| ප්‍රකාශය කළේ කාටද? | | |
| ඇතුළත් පාඩමේ නම | | |
| ඇතුළත් ග්‍රන්ථය | | |
| කතුවරයා | | |

(ල.2x5= 10)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

යලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

7) පහත සඳහන් වගුව පෙළ පොත ඇසුරින් සම්පූර්ණ කරන්න.

| චරිත | ග්‍රන්ථයේ නම | කතුවරයා |
|---|---|---|
| මුවන්තිස්ස කුමාරයා | | |
| පොරමොලා | | |
| ඉබ්බා | | |
| කෝපි කඩයට රැස් වූ මහලු ගැමියෝ | | |
| රතු ඇස් ඇති කුරුල්ලා | | |

(ල.2 x 5= 10)

8) සුදුසු පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. ...................................උනන්දුවෙන් ඉගෙන ගනිති.

ii. අපි හොඳ ...................................................වෙමු.

iii. රජතුමා උයන් සිරි...................................................

iv. මහ සුළඟට ගස්...................................................

v. තාරකාවෝ අහසේ තිවි තිවී...................................

vi. ආදි වාසීහු ගල් ලෙන් තුළ ජිවත් ..........................

vii. ..............................................අභ්‍යාස නිම කළෙහු ද?

viii. ගුරුවරු................................................යහමග යවති.

ix. මුව රැළ බිය වී වේගයෙන්...........................................

x. උපාසිකාව මල් රැගෙන පන්සල්.............................

(ල.1x10= 10)

(ලකුණු 60)

(මුළු ලකුණු 100)

agaram.lk



agaram.lk

www.agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk

agaram.lk